# විද්‍යොදය ධර්ම ශාස්ත්‍රීය සංග්‍රහය

## සයාම රාජ ත්‍යාග ශත සංවත්සර විශේෂ කලාපය

17. 05. 1989


සංස්කාරකවරු:

අකුරටියේ නන්ද හිමි

වැගම පියරතන හිමි

නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි



මාලිගාකන්ද විද්‍යොදය පිරිවෙණේ ප්‍රකාශනයකි

2533 / 1989 අප්‍රේල් මස 29 දින

# සීගිරියේ ලෙන් චිත්‍ර

කථිකාචාර්ය, අනුර මනතුංග

සීගිරි පර්වත බෙයදයේ පිහිටි කෙවණිවල ඇති ස්ත්‍රී රූප 'සීගිරි චිත්‍ර' ලෙස බොහෝ දෙනා හඳුනති. මේ ජනප්‍රිය ස්ත්‍රී රූප හැරුණු විට 'සීගිරි චිත්‍ර' ලෙස ගිණිය හැකි චිත්‍ර රැසක් පර්වතය පාමුල පිහිටි ගල්ලෙන්වල දක්නට ඇත. මෙතෙක් සැලකිය යුතු අවධානයකට ලක් වී නොමැති එම චිත්‍ර ගැන කරුණු දැක්වීම මේ ලිපියේ අරමුණය.[1]

කටාරම් කොටන ලද ගල්ලෙන් විසි හතක් සීගිරි පර්වතය පාමුල පිහිටියේය. මේ ගල්ලෙන් සියල්ලම, නැතහොත් ඒ අතරින් වැඩි කොටසක් අතීතයේදී චිත්‍රකර්මයට ලක් වී ඇත. ලෙන් කීපයක ම තවමත් පැහැදිලි ව හඳුනා ගත හැකි තරමින් චිත්‍ර හෝ චිත්‍රවල කොටස් දුටුව හැකිය, තවත් ලෙන් රැසක ම වර්ණ විශේෂ සහ චිත්‍ර ඇඳීමට පාදක කොට ගත් බදාමය කපරාරුව හෝ එහි කොටස් දක්නට ඇත.

සීගිරි ඉතිහාසයේ අවධි කීපයක්ම මේ ලෙන් චිත්‍රවලින් නියෝජනය වී ඇත. එක මත එක පිහිටි බදාම තට්ටු සහ චිත්‍ර තලවලින් ඒ බව පැහැදිලි ය. පර්වත බෙයදයේ චිත්‍ර ඇඳීමට පෙර පවා ඇතැම් විට මේ ලෙන්වල චිත්‍ර අඳින්නට ඇතැයි අනුමාන කළ හැකිය. එහෙත් එකලට අයත් යැයි නිසැකවම පෙන්වා දිය හැකි චිත්‍ර කිසිවක් අද දක්නට නොමැත. දැනට ඉතිරි ව ඇති චිත්‍ර සියල්ල කාශ්‍යප සමයට (ක්‍රි. ව. 477–495) සහ පශ්චාත් කාශ්‍යප යුගයේ අවධි කීපයකට අයත් විය හැකි ය.

සීගිරියේ ජනප්‍රිය ස්ත්‍රී රූප එම පර්වතය සමග පමණක් සම්බන්ධ වූ ඒවා නො වන බව ලෙන් චිත්‍රවලට අනුව තේරුම් ගත හැකි ය. පර්වතය බලා යන මාර්ගයන් ආශ්‍රිතව පිහිටි ලෙන් තුනකම ස්ත්‍රී රූප හෝ ඒවායේ කොටස් ඉතිරි ව ඇත. විෂය සහ ශෛලිය අතින් මේවා පර්වත බෙයදයේ චිත්‍රවලට බෙහෙවින් සමාන ය. එහෙත් ඇතැම් කරුණුවලට අනුව මේ ස්ථාන දෙකේ ඇති ස්ත්‍රී රූපවල වෙනස්කම් ද දුටුව හැකි ය. බෙයදයේ චිත්‍ර කිසිවක නිතඹින් පහත කොටස දක්වා නැතත්, එක් ලෙනක ඇති රූප කීපයක ඉන් පහත කොටස ද චිත්‍රණය කර ඇත. පොදුවේ සලකා බලන විට බෙයදයේ චිත්‍රවලට වඩා මේ ස්ත්‍රී රූප ප්‍රමාණයෙන් කුඩාය. බෙයදයේ චිත්‍ර සඳහා භාවිතා කර නොමැති නිල් පැහැය ලෙන් චිත්‍ර සඳහා යොදා ගෙන ඇත, එම පැහැය යෙදුණු ඇතැම් අවස්ථා බෙයදයේ චිත්‍ර හා සමකාලීන යැයි කිව නොහැකි මුත්, සියළු අවස්ථා එසේ නොවෙතැයි සිතිය නොහැකි ය.

'සීගිරි චිත්‍ර' වූ කලී ස්ත්‍රී රූප ම නො වන බව ද ලෙන් චිත්‍රවලින් පැහැදිලි කර ගත හැකි ය. ස්ත්‍රී රූප සහිත ලෙන්වල ද වෙනත් ලෙන් කීපයක ද ඊට පරිබාහිර වූ චිත්‍රකර්ම දක්නට ඇත. වෘක්ෂ සහ පත්‍ර, මල් මෝස්තර, ජ්‍යාමිතික රටා, සත්ව සහ පුද්ගල රූප ඒ අතර දුටුව හැකි ය.

මෙහි පහත එකිනෙක ලෙනේ ඇති චිත්‍ර පිළිබඳ කරුණු දක්වා ඇත. මෙහිදී එම ලෙන් අංකනය කර ඇත්තේ බෙල්[2] විසින් ද පසුව ගොඩකුඹුර විසින් ද යොදන ලද අංක අනුවය. 'බී' (B) අක්ෂරය පෙරටු කොට බෙල් අංක ද, අක්ෂරයකින් තොර ව ගොඩකුඹුර ගේ අංක ද මෙහි යොදා ඇත. මේ අංක මෙලෙස එම ගල්ලෙන්වල යොදා තිබීම මෙහිලා එම ක්‍රමය භාවිතා කිරීමට හේතු විය. ව්‍යවහාරික නමක් ඇති ලෙන්වලට අංක හැරුණු විට එම නම ද යොදා ඇත.